**පාතදුම්බර ප්‍රාදේශීය සභාව - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හිඟහිටි වෙනත් ආදායම පොදු ලෙජරයේ රු.74,228,380 ක් වුවත් එය මූල්‍ය ප්‍රකාශනවල රු.66,671,010 ක් ලෙස රු.7,557,370 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | නාගරික සංවර්ධන ඉතුරුම් ගිණුමේ සමාලෝචිත වර්ෂයේ පොළිය රු.343,181 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) | ජල සේවා වැඩසටහනේ ප්‍රවාහන සබඳතා හා අවශ්‍ය සේවා සඳහා සමාලෝචිත වර්ෂයේ වියදම රු.716,740 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු බව. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළව සංවර්ධන ව්‍යාපෘති 06 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.1,893,455 ක වටිනාකම ණයහිමියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | අතපසුවීමකින් එම වටිනාකම සඳහා වන උපලේඛනයේ එම සංවර්ධන ව්‍යාපෘති ඇතුලත් වී නොමැත. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු බව. |
| (ඉ) | අවස්ථා 18 කට අදාළව ගෙවිය යුතුව තිබූ රු.3,373,565 ක් ගිණුම්වලින් අත්හැරීම හේතුවෙන් විවිධ ණයහිමියන් සහ වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | රු.3,373,565 ක් වටිනා විවිධ ණයහිමියන්ට අදාළ වැරදි නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු බව. |

### 1.6.2 අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මාර්ග පුළුල් කිරීම, බැමි කඩා දැමීම, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම හා බෝක්කු අවහිර කිරීම සම්බන්ධයෙන් සභාවට විරුද්ධව බාහිර පාර්ශවකරුවන් 18 දෙනෙකු 2004 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ගොනුකර ඇති නඩු පිළිබඳව ගිණුම් සටහන් මඟින් අනාවරණය කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | අවශ්‍ය තොරතුරු අනාවරණය කළ යුතු බව. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.455,357,654 ක් වූ ගිණුම් විෂයයන් 23 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, රු.125,466,511 ක වෙනසක් පැවතුණි. | වෙනස්කම් වලට හේතු සොයා කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු යොදා ඇති බව දන්වා සිටිමි. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතු බව. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වටිනාකම රු.26,555,451 ක් වූ ගිණුම් විෂයයන් 6 කට අදාළව උපලේඛන හා ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | වත්කම් සමීක්ෂණ කටයුතු අවසන් වූ පසුව නිවැරදි උපලේඛන ඉදිරිපත් කරමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,080,319 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,423,583 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යන පෞද්ගලික ඇඟලුම්හලකින් 2018 වර්ෂයේ සිට අයවිය යුතු රු.129,888 ක හිඟ වරිපනම් අය කරගෙන නොතිබුණි. | මෙම ආයතනය සම්බන්ධයෙන්ද නෛතික ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරෙන බව දන්වා සිටිමි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම්කාර්යාලයෙන් හා අනෙකුත් ආයතනවලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.344,330 ක් හා මුද්දර ගාස්තු රු.29,122,168 ක් හිඟව පැවතුණි. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ලැබිය යුතු වටිනාකම හා ලැබූ මුදල් ගලපා නියමිත පරිදි ගිණුම් තැබීමට කටයුතු කර ඇත. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමටත්, ඒවා නියමිත පරිදි ගිණුම් තැබීමටත් කටයුතු කළ යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී අලුත්ගම පොළ අලුත්වැඩියා කිරීම සඳහා රු.1,980,000 වැය කර තිබුණද පොළ ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා ගැනීමට නොහැකිවී තිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ අංක:සීපීසී/සීඑල්ජී/4/1/පොදු සහ 2021.04.27 දිනැති ලිපියෙන් ලබා දී ඇති විධිවිධාන ප්‍රකාරව අලුත්ගම සතිපොළ සම්බන්ධව මහා සභා තීරණයක් මත ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කෙරේ. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු බව. |

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අළුත්වත්ත ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ආදායම් හා වියදම් පාතදුම්බර හා කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා දෙක ඒකාබද්ධව සම සමව බෙදා ගැනීම සඳහා ගිවිසුම්ගත වී ව්‍යාපෘතිය සඳහා පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් රු.3,339,857 ක වියදමක් දරා ඇතත් කිසිදු ආදායමක් ලබා ගැනීමට වගකිව යුතු නිලධාරීන් විසින් මෙතෙක් කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන ආයතන දෙකෙහි ව්‍යාපෘතියෙහි සමස්ත ආදායම් හා වියදම් ඒකාබද්ධ අරමුදලකට බැර කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් සිදුකර තිබූ නමුත් කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව මෙම ගැටලුව සම්බන්ධව ප්‍රමාණවත් සැලකිල්ලක් නොදැක්වීම හේතුවෙන් ඉදිරි කටයුතු කරගෙන යාම දුෂ්කර වී ඇත. | ව්‍යාපෘතිය ගිවිසුම් ප්‍රකාරව විධිමත්ව පවත්වාගෙන යාමටත් සභාවට හිමි ආදායම් ලබා ගැනීමටත් කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2016 වර්ෂයේ කොටස් කර වෙන්දේසි කරන ලද මැදිකැලේ හේනවත්ත ඉඩමෙන් සභාවට පැවරිය යුතු ඉඩම් දෙකෙන් පර්චස් 22 ක ඉඩම සමාලෝචිත වර්ෂය වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වෙන්දේසි ඉඩමේ කොටස් 2ක් සභාව සතුව පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | විධිමත්ව පවරා නොගත් ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැති ශේෂයන්ගේ එකතු වටිනාකම රු.39,984,889 ක්ද ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1 සිට 3 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂවල එකතුව රු.191,664 ක්ද වූ අතර, වසර 3 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.724,003 ක් වී තිබුණි. | සභාවේ කර්මාන්ත ණයගැතියන් ප්‍රතිපූර්ණය සඳහා යොමු කර ඇති අතර ඒ පිලිබඳ පසුවිපරම් කිරීමට ද කටයුතු යොදා ඇත. | අයවිය යුතු ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 5 ක එකතුව රු.63,052,412 ක් වූ අතර කාල විශ්ලේෂණයට අනුව වසර 1 සිට 3 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂවල එකතුව රු.59,282,990 ක් හා වසර 3 ට වැඩි ශේෂවල එකතුව රු.3,769,422 ක් විය. | මෙම අයිතම පිළිබඳව සොයා බලා කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන අතර නාගරික සංවර්ධන තැන්පතු ගිණුමේ ශේෂය නාගරික සංවර්ධන අධිකාරියේ ද අනුමැතිය යටතේ අනුමත එළදායී සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා ආයෝජනය කිරීමට අපේක්ෂිතය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ඉ) | ප්‍රාදේශීය සභා අරමුදලේ මුදල් සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදා ගැනීම හෝ පනතේ 131 වගන්තිය අනුව ආයෝජනය කිරීමට හෝ රු.76,506,259 ක් වන බාහිර බැදීම් පියවීමට හෝ කටයුතු නොකර මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ රු.27,274,935 සිට රු.111,066,694 ක් දක්වා පරාසයක සමාලෝචිත වර්ෂය පුරා නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය. | බාහිර බැදීම් වටිනාකම් සියල්ල පියවන තෙක් එම වටිනාකම් සභාව සතු ජංගම ගිණුමේ පවත්වාගෙන යා යුතු බව පෙන්වා දෙමි. | ජංගම ගිණුමේ නිෂ්කාර්යව වැඩි කාලයක් මුදල් නොපවතින ආකාරයෙන් මූල්‍ය කළමනාකරණය විධිමත්ව සැලසුම් කළ යුතු බව. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු රු.5,302,340 ක් වටිනා වතුර බවුසරය හා ජල මෝටරය, ට්‍රැක්ටරය හා ගලි බවුසරය, සිංගර් පාපැදිය, ට්‍රැක්ටරය හා කසළ කරත්තය යන වාහන 05 වසර 05 - 10 ත් අතර කාලයක සිට නිෂ්ක්‍රීයව පවත්නා අතර, එම වාහන යථා තත්ත්වයට පත් කර ගැනීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. | නිශ්ක්‍රීයව පැවති වාහන 08 න් වත්කම් 03 ක් වෙන්දේසි කර ඇති බවත්, තොරතුරු නොමැති වත්කම් 02 ක් සම්බන්ධයෙන් තොරතුරු සොයා බැලීමටත්, ඉතිරි වත්කම් කුලී පදනම මත ලබාදීමටත් කටුයුතු කර ඇත. | වත්කම් නිශ්ක්‍රීයව පැවතීම වැළැක්වීමට කටයුතු කළ යුතු බව. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය හා වැඩ තහනම් කළ හා සේවය හැරගිය නිලධාරීන් 8 දෙනෙකුගේ එකතුව රු.477,657 ක්වූ ආපදා ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමි. | අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මඩවල නගරය අසලින් ගලායන බලතොට ඔය අවහිර වන ලෙස අනවසර ඉදිකිරීම් සිදුකර තිබූ අතර, ඔයට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් ඔය අපිරිසිදු වී තිබුණද ඒ සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් 2021 වර්ෂයේදී මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් හා ඒකාබද්ධව පරීක්ෂණ සිදු කර ඇති බවත් තවදුරටත් ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු යොදා ඇති බව. | පරිසර හානි අවම වන ආකාරයට කටයුතු කළ යුතු බව. |

## 4.2 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අප්‍රේල් 23 දිනැති අංක විලේ. පොදු/2018/61 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක 17 ක් හඳුනාගෙන රු.400,000 ක ප්‍රතිපාදනයක් වෙන් කර ඇතත් එම ඉලක්ක කරා ළඟා වීමට අපොහොසත් වී තිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක වෙනුවෙන් වාර්ෂික අයවැය ලේඛනයේ 505(7) වැය ශීර්ෂය යටතේ රු.4,00,000 ක ප්‍රතිපාදනයක් වෙන්ව ඇති බවත් ඉන් රු.65,000 ක් අදාළ කාර්යයන් සඳහා වැයකර ඇති බව. | තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු බව. |